ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

லங்கா லேலன்ட் (சொந்த) லிமிடட்

LANKA LEYLAND (PRIVATE) LIMITED

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

31 மார்ச் 2017 முடிவடைந்த ஆண்டுக்கான

YEAR ENDED 31ST MARCH 2017

වාර්ෂික වාර්තාව

நிதி அறிக்கைகள்

ANNUAL REPORT

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

වාර්ෂික වාර්තාව

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තා

2017 මාර්තු මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ විගණන ගිණුම් සමඟ සිය වාර්තා සාමාජිකයින් වෙත ඉදිරිපත් කිරීම සතුටට කරුණකි.

සමාගමේ කාර්යභාරය

වර්තමානයේ සමාගමේ ප්‍රධාන කාර්යභාරය වන්නේ එහි ප්‍රධාන ආයෝජනයක් වන අශෝන් ලේලන්ඩ් පී එල්සී හි ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම හා මඟ පෙන්වීමයි.

මාර්තු මස 31 දිනෙන් අවසන් වර්ෂය

අයභාරය

පොළී ආදායම්	6,419,171
පරිපාලන වියදම්	(3,719,024)
ආශ්‍රිත සමාගම් හි ආයෝජනයෙන් ලද ලාභය / (අලාභය)	(682,742,500)
වෙනත් වියදම්	(3,505)
මෙහෙයුම් ලාභය / අලාභය	(680,045,858)
මූල්‍ය ආදායම්	34,031,250
බදු පෙර ලාභය / අලාභය	(646,014,608)
බදු වියදම	(1,797,368)
වර්ෂයට අදාල ලාභය (අලාභය)	(647,811,976)
වෙනත් විස්තීරණ ආදායම් / වියදම්	-
වර්ෂයට අදාළ මුළු විස්තීරණ ආදායම (වියදම්)	(647,811,976)

අධ්‍යක්ෂ මණ්ඩලය

ආචාර්ය එම් එස්.මීරාසහීබ් මහතා	සභාපති
එස්.ආනන්දරාසා මහතා	අධ්‍යක්ෂ
ජී.එම්.කේ.හෙට්ටිආරච්චි මහතා	අධ්‍යක්ෂ
ජස්රි ජවබ්දීන් මහතා	අධ්‍යක්ෂ
ඒ.එම්. ජහන්සර් මහතා	අධ්‍යක්ෂ
කේ.ඩී.ඒ.එස්. අර්සකුලරත්න මහතා	අධ්‍යක්ෂ

ලාභාංශ

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු.34,031,250.00 ක ලාභාංශ වශයෙන් ප්‍රකාශයට පත්කර ඇතිබව අධ්‍යක්ෂවරු ලෙස අප සතුටු වන්නෙමු.

සමාගම හා අධ්‍යක්ෂවරු තර ඇති ගිවිසුම් සම්බන්ධ උනන්දුව

සමාගම හා අධ්‍යක්ෂවරු අතර ඇති ගිවිසුම් සම්බන්ධ උනන්දුව මූල්‍ය ප්‍රකාශ තුළ සටහන් 17 න් පෙන්වයි.

විගණකවරු

වර්ෂය සඳහා ගිණුම් විගණනය, නැවත පත්වීමට නම් ඉදිරිපත් කර ඇති විගණකාධිපති විසින් විගණනය කර ඇත.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගමේ කොටස්හිමියන් වෙත,

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණකගේ වාර්තාව

ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගමේ මූල්‍ය ප්‍රකාශන, එනම් 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ලාභ අලාභ හා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ද වෙනත් පැහැදිලි කිරීම් වලින් සමන්විත සටහන් ද මගේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) හි විධිවිධාන අනුව විගණනය සිදුකරන ලදී. මෙම විගණනය සිදුකිරීම සඳහා මා විසින් පොදු පරිචයෙහි යෙදෙන ගණකාධිකාරී ආයතනයක සහය ලබා ගතිමි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකාරීත්වයේ වගකීම.

සුළු හා මධ්‍ය පරිමාණ ආයතන වලට අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් වේ. මෙම වගකීමට අයත් වනුයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලන සැලසුම් කිරීම,ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන වැරදි සහගත ප්‍රකාශ වලින් තොර බවට වගබලා ගැනීම සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීම ඒම වගකීමට අයත් වේ.

විගණකගේ වගකීම.

මාගේ විගණනය පවත්වාගෙන යන ලද්දේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලවය. ඒ අනුව අදාළ මූල්‍ය වාර්තා වැරදි සහගත ප්‍රකාශ වලින් තොර බවට සහතික වන පරිදි අපගේ විගණනය සැලසුම් කර පවත්වාගෙන යන ලදී.

ඉහත සඳහන් මූල්‍ය වාර්තා වල ඇතුළත් සංඛ්‍යා පැහැදිලි කිරීම් සහ අදාළ කරගත් ගිණුම් ප්‍රතිපත්ති හා අධ්‍යක්ෂවරුන් කර ඇති ඇස්තමේන්තු ආදිය තහවුරු කරගැනීම වස් අදාළ සාක්ෂි, පරීක්ෂණ පදනමක් යටතේ භාවිතා කළ අතර මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අදාළ පිළියෙල කර ඇත්දැයි යන්න පරීක්ෂා කරන ලදී. විගණනය සඳහා අදාළ වේ යැයි අප විසින් විශ්වාස කළ සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් අප විසින් ලබාගන්නා ලදී. එම නිසා අප විසින් කරන ලද විගණනයන් විගණන මතය සඳහා ප්‍රමාණවත් හා සුදුසු බව අපගේ විශ්වාසයයි.

මතය

මාගේ මතය අනුව, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගම විසින් නිසි ගිණුම් පොත් පවත්වා ඇති අතර, ඒට අදාළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇත.

මතය අවධාරණය කිරීම

මාගේ විගණන මතය වෙනස් නොකර, මා විසින් මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 04 කෙරෙහි අවධානය යොමු කරන අතර ඒ අනුව එහි සඳහන් භූමිය වර්තමානයේ සමාගම භාවිතයේ නැති බවට මා වසින් අවධාරණය කරන්නෙමු.

වෙනත් කරුණු

2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශන වෙනත් විගණකවරයෙකු විසින් විගණනය කරන ලද අතර සමාගම මුදල් පදනම මත පොළී ආදායම හඳුනාගෙන ඇති බැවින් එම විගණකවරයා විසින් 2016 අගෝස්තු 04 දින එම මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය මතයක් ඉදිරිපත් කරන ලදී.

වෙනත් නීතිමය හා රෙගුලාසි අවශ්‍යතාවයන්

2007 අංක 07 දරණ සමාගම් පනතේ 163 (2) වගන්තියේ පහත සඳහන් දෑ දැක්වේ.

(අ) මතය, විෂය පථය හා විගණනයේ සීමාකම් ඉහත සඳහන් කල පරිදි වේ.

(ආ) අපගේ මතය අනුව

- විගණනය සඳහා අදාළ වේ යැයි අප විසින් විශ්වාස කළ සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් අප විසින් ලබාගන්නා ලදී. සමාගම විසින් නිසි ගිණුම් පොත්පත් හා වාර්තා පවත්වාගෙන ගොස් ඇත.

මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 (2) වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

පාර්ලිමේන්තුව සඳහා වාර්තාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන වලට අනුව මාගේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

මාර්තු මස 31 දිනට	සටහන්	2017	2016
		රු.	රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	4	626,473	626,473
ආශ්‍රිත සමාගම් හි ආයෝජන	5	1,606,275,000	2,289,017,500
මුළු ජංගම නොවන වත්කම්		1,606,901,473	2,289,643,973
ජංගම වත්කම්			
ආයෝජන	6	56,724,314	56,253,592
මුදල් හා මුදල් සමාන දෑ	7	5,339,890	4,460,004
මුළු ජංගම වත්කම්		62,064,204	60,713,596
මුළු වත්කම්		1,668,965,677	2,350,357,569
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධන හා සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	8	8,958,600	8,958,600
පොදු සංචිත		9,800,924	9,800,924
රඳවාගත් ලාභ		1,648,991,438	2,330,834,664
මුළු හිමිකම් හා සංචිත		1,667,750,962	2,349,594,188
ජංගම වගකීම්			
උපචිත වියදම්		52,000	64,397
බදු වගකීම්		1,162,715	698,984
මුළු ජංගම වගකීම්		1,214,715	763,381
මුළු වගකීම්		1,214,715	763,381
මුළු හිමිකම් හා වගකීම්		1,668,965,677	2,350,357,569

සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව වේ.

....

ප්‍රධාන මූල්‍ය නිලධාරි

මෙම මූල්‍ය ප්‍රකශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරන අතර සහතික කර අත්සන් කරන ලදී.

....	....
අධ්‍යක්ෂ	**අධ්‍යක්ෂ**

කොළඹ

2017 මාර්තු 29 වන දින.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

ලාභ අලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

මාර්තු මස 31 දිනෙන් අවසන් වසර සඳහා	සටහන්	2017	2016
		රු.	රු.
අයභාරය	10	6,419,171	3,883,244
		6,419,171	3,883,244
පරිපාලන වියදම්		(3,719,024)	(3,045,107)
ආශ්‍රිත සමාගම් හි ආයෝජනයේ මත සාධාරණ අගය වෙස්වීම්හි ලාභය / අලාභය	5.2	(682,742,500)	322,767,500
වෙනත් මෙහෙයුම් වියදම්		(3,505)	(4,232)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ලාභය		(680,045,858)	323,601,405
ශුද්ධ මූල්‍ය ආදායම්	11	34,031,250	54,450,000
බදු පෙර ලාභය / අලාභය	12	(646,014,608)	378,051,405
බදු වියදම්	13	(1,797,368)	(1,087,308)
වර්ෂය සඳහා ලාභය/ අලාභය		(647,811,976)	376,964,097
වෙනත් විස්තීරණ ආදායම්			
මුළු වෙනත් විස්තීරණ ආදායම්			
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම් / (වියදම්)		(647,811,976)	376,964,097

අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය කොටසකි.
වරහන් තුල දක්වා ඇති සංඛ්‍යා වලින් අඩුකිරීම් පෙන්නුම් කරයි.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය

2017 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.	පොදු සංචිත රු.	රඳවාගත් ලාභ රු.	මුළු හිමිකම රු.
2015 අප්‍රේල් 01 දින ශේෂය	8,958,600	9,800,924	2,008,320,567	2,027,080,092
වර්ෂය සඳහා මුළු විස්තීරණ **ආදායම**				
වර්ෂය සඳහා ලාභය	-	-	376,964,097	376,964,097
වර්ෂය සඳහා මුළු විස්තී ආදායම			376,964,097	376,964,097
සමාගමේ අයිතිකරුවන් සමග වූ ගණුදෙනු	-	-	(54,450,000)	(54,450,000)
ලාභාංශ				
සමාගමේ අයිතිකරුවන් සමග සිදුකළ මුළු ගණුදෙනු			(54,450,000)	(54,450,000)
2016 මාර්තු 31 දිනට ශේෂය	8,958,600	9,800,924	2,330,834,664	2349,594,188
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම් / වියදම්				
වර්ෂය සඳහා අලාභය	-	-	(647,811,976)	(647,811,976)
වර්ෂය සඳහා මුළු විස්තීරණ වියදම්	-	-	(647,811,976)	(657,811,976)
සමාගමේ අයිතිකරුවන් සමග වූ ගණුදෙනු				
ලාභාංශ	-	-	(34,031,250)	(34,031,250)
සමාගමේ අයිතිකරුවන් සමග වූ මුළු ගණුදෙනු	-	-	(34,031,250)	(34,031,250)
2017 මාර්තු 31 දිනට ශේෂය	8,958,600	9,800,924	1,648,991,438	1,667,750,962

අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය කොටසකි.

වරහන් තුල දක්වා ඇති සංඛ්‍යා වලින් අඩුකිරීම් පෙන්නුම් කරයි.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මාර්තු මස 31 දිනෙන් අවසන් වසර සඳහා	සටහන	2017	2016
		රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
බදු පෙර ලාභය / අලාභය		(646,014,608)	(378,051,405)
ගැලපීම්			
පොළී ආදායම්	10	(6,419,171)	(3,883,244)
ක්ෂය	4	-	1,396
ලාභාංශ ආදායම්	11	(34,031,250)	(54,450,000)
ආශ්‍රිත සමාගම් හි ආයෝජනයන් වල සාධාරණ අගය වෙනස්වීමේ ලාභය/ අලාභය	5.2	682,742,5900	(322,767,500)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් වලට පෙර අලාභය		(3,722,529)	(3,047,943)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්			
වෙනත් ලැබිය යුතු දෑ හි වැඩිවීම / (අඩුවීම)		(12,397)	8,617
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල්		(3,734,926)	(3,039,326)
බදු ගෙවීම්		(1,333,637)	(771,625)
පොළී ලැබීම්	10	6,419,171	3,883,244
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		1,350,607	71,293
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
ආයෝජන මිලට ගැනීම්		(470,722)	(32,434,156)
ලාභාංශ ලැබීම්		34,031,250	54,450,000
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		33,560,528	22,015,844
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
ලාභාංශ ගෙවීම්		(34,031,250)	(54,450,000)
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		(34,031,250)	(54,450,000)
වර්ෂය තුල සිදු වූ මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම / අඩුවීම		879,886	(32,362,864)
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා මුදල් සමාන දෑ		4,460,004	36,822,867
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		5,339,890	4,460,004
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ විශ්ලේෂණය			
බැංකු මුදල්	7	5,339,890	4,460,004
		5,339,890	4,460,004

අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය කොටසකි.

වරහන් තුල දක්වා ඇති සංඛ්‍යා වලින් අඩුකිරීම් පෙන්නුම් කරයි.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

1.වාර්තාකරණ සමාගම

1.1 ස්ථිර හා නෛතික රාමුව

සීමාසහිත ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇති අංක 80/12, රබර්වත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ යන ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇති සීමිත පුද්ගලික සමාගමකි.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් තත්වය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ භාණ්ඩාගාර බිල්පත් වල සහ ස්ථාවර තැන්පතු වල මුදල් ආයෝජනය කිරීමයි.

1.3 මව් සමාගම

සමාගමේ මව් සමාගම වන්නේ රාජ්‍ය භාණ්ඩාගාරයේ ලේකම් වේ.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ලාභ අලාභ හා විස්තීරණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශ, මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඇතුළු වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළියෙල කර ඇත.

2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශය පිළියෙල කර ඇත්තේ අතීත පිරිවැය පදනම් කරගනිමින් වන අතර කාලච්ඡේදය පුරාවට සංගතභාවයකින් යුතුව පවත්වාගෙන ගොස් ඇති අතර පහත සඳහන් දෑ සඳහා හැර මූල්‍ය ප්‍රකාශන සඳහා කිසිදු උද්ධමන සාධක බලෑමක් ගලපා නැත.

- ව්‍යුත්පන්න නොවන මූල්‍ය උපකරණ, ණය හා ලැබිය යුතු දෑ ලෙස පෙන්වා ඇති අතර අනෙකුත් මූල්‍ය වගකීම් ක්‍රම ක්ෂය පිරිවැයට පෙන්වා ඇත.
- විකිණීමට ඇති මූල්‍ය වත්කම් අගය කර ඇත්තේ සාධාරණ වටිනාකම මතය.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ අනාගත අපේක්ෂිත කාලයක් දක්වා සමාගම පවතී යන්න පදනම කොටගෙනය.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

- **හානිකරණය තක්සේරු කිරීම.**

සමාගම විසින් සෑම ගිණුම්කරණ වර්ෂයකට වරක් වත්කම් හාණිකරණය වී ඇති බවට කිසියම් පෙන්නුම් කිරීමක් සමාගමේ සිදු වී ඇත්දැයි තක්සේරු කල යුතුය. මෙහිදී වත්කම් වලින් ජනිත වන මුදල් ප්‍රවාහය වෙන වෙනම හඳුනාගත නොහැකි නම් සමාගම විසින් එම වත්කම් අන්තර්ගත වන සමස්ත ඒකකයම සලකා බලා වත්කමේ නැවත අයකරගත හැකි අගය තීරණය කල යුතුය.

- **වර්තමාන බද්ද**

සැබෑ බදු වගකීම් පිළිඹිබු කරන කළමණාකාරිත්වය විශ්වාස කරන අදාළ බදු ප්‍රතිශෝධන සහ රෙගුලාසි අනුගමනය කරමින් මූල්‍ය ප්‍රකාශන වල වර්තමාන බදු වගකීම් සපයා ඇත.

2.8 අඛණ්ඩ පැවැත්ම

ඉදිරි අනාගතය තුළ සිය මෙහෙයුම් දිගටම කරගෙන යාමට සමාගමට ප්‍රමාණවත සම්පත් තිබෙන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කර තිබේ.එබැවින් අඛණ්ඩ පැවැත්ම සංකල්පය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

3.වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාගම විසින් පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒකාකරි ලෙස සියලුම කාලච්ඡේද වලදී මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් කර ඇත.

3.1 සමස්ථ සලකා බැලීම

පහත දැක්වෙන්නේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කල වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශයකි.

3.2 ආශ්‍රිත සමාගම්හි ආයෝජන

සමාගම විසින් සිදුකර ඇති ආයෝජනයන්ගේ අගය මත එකී සමාගම්වල පාලනය සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක බලපෑමක් සිදුකල හැකි ආයෝජනයක ආශ්‍රිත සමාගම්හි ආයෝජනයන් ලෙස ගිණුම්කරණය කර ඇති අතර බද්ධ ව්‍යාපාරය හා පරිපාලන සමාගම් මෙයට ඇතුලත් නොවේ.මෙම ආයෝජනයන් සිදුකරන ලද ආයෝජනයේ පිරිවැයට පළමුව හඳුනාගෙන ඇති අතර ඉන්පසු ඒවායේ සාධාරණ අගයට ගිණුම්ගත කර ඇත.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

2.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම.

සුළු හා මධ්‍ය පරිමාණ ආයතන වලට අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

2.4 මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, අධ්‍යක්ෂවරු වෙත 2017 මැයි 29 දින අනුමත කිරීමට යවන ලදී.

2.5 ක්‍රියාකාරි හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහර මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය සමාගමේ ක්‍රියාකාරි මුදල් ඒකකය වේ.සියලුම මූල්‍ය තොරතුරු සමීපතම රුපියලට වටයමින් ඉදිරිපත් කර ඇත.

2.6 ප්‍රමාණාත්මතාවය

එක් එක් ප්‍රමාණාත්මක සම කාණ්ඩයන් මූල්‍ය ප්‍රකාශන තුල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. ප්‍රමාණාත්මක නොවූ අසම කාණ්ඩයන් ද මූල්‍ය ප්‍රකාශන තුල වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

2.7 ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතය

මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අනුකූලව පිළියෙල කර ඇති අතර පහත සඳහන් වත්කම්,වගකීම්, ආදායම් හා වියදම් අගය කිරීමේදී හා හඳුනා ගැනීමේදී අදාළ ඇස්තමේන්තු හා උපකල්පන වලට අදාළ තොරතුරු වල සාධාරණත්වය ඉතා ඉහළ කාර්යභාරයක් සිදුකරයි. එසේ වුවද සත්‍ය ප්‍රථිඵල හා මෙම ඇස්තමේන්තුගත තොරතුරු අතර ප්‍රමාණාත්මක වෙනසක් තිබිය හැක.

ඇස්තමේන්තු හා උපකල්පන අඛණ්ඩ පදනම මත සමාලෝචනය කෙරේ. ගිණුම් ඇස්තමේන්තු වලට අදාළ සංශෝධන ඇස්තමේන්තු වෙනස් කරනු ලබන කාලය හා ඉදිරි ඕනෑම කාල පරිච්ඡේදයකදී පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශයන්හි පිළිගත් සැලකිය යුතු බලපෑමක් කල හැකි ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී විවේනාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සඳහන් සටහන් වල ඇතුළත් කර ඇත.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

3.3 මූල්‍ය උපකරණ

3.3.3 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්

සමාගම විසින් ණය හා ලැබිය යුතු දෑ පළමුව ඇතිවූ දිනයේදි හදුනාගනී. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් මූලිකව හදුනාගන්නේ වෙළදාම් දිනය පදනම් කොට ගෙනය. එනම්, මූල්‍ය උපකරණ සඳහා සමාගම් විසින් ගිවිසුම්ගත බැදීමක් ඇතිකරගත් දිනයයි.

අදාළ මූල්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් නොකිරීම සිදුකරන්නේ,සමාගම විසින් අදාළ වත්කම කල්පිරීමෙන් හෝ මාරුකිරීමෙන් ඇතිවන මුදල් ප්‍රවාහයන් ලබාගැනීමේ ගිවිසුම්ගත බැදීම හා අනෙකුත් සියලුම වත්කම් සම්බන්ධ අවධානම් මාරුවීමෙන් අනතුරුවය.යම් ආදායම් තත්වයක් නිර්මාණය වීම හෝ රදවා තබාගන්නේනම් එම කොටස සමාගම විසින් වෙනමම වත්කමක් හෝ වගකීමක් ලෙස හදුනාගනී.

සමාගම වෙත වත්කම් වගකීම් හිලව් කිරීමට නීතිමය අයිතියක් ඇත්නම්, මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කර ශුද්ධ වටිනාකම මූල්‍ය තත්ව ප්‍රකාශයේ පෙන්නුම් කළ හැක.

(a) සමාගම වෙත ණය උපකරණ කල්පිරෙන තෙක් රදවා තබාගත ගැනීමට හැකියාවක් ඇත්නම්, එම මූල්‍ය වත්කම් ලෙස දැක්විය හැක. මෙම මූල්‍ය වත්කම් පළමුව සාධාරණ වටිනාකමට අනෙකුත් ඍජු සම්බන්ධිත ගණුදෙනු පිරිවැය එකතු කිරීමෙන් හදුනාගත හැකි අතර ඉන්පසු ක්‍රමක්ෂය පිරිවැයෙන් අනෙකුත් හානිකරණ අලාභ අඩුකිරීමෙන් පසු අගයට හදුනා ගැනේ.

ස්ථාවර තැන්පතු හා අනෙකුත් භාණ්ඩාගාර ආයෝජන මීට ඇතුලත් වේ.

(b) ණය හා ලැබිය යුතු දෑ

ණය හා උපකරණ ස්ථාවර හා කලින් හදුනාගත් ගෙවීම් සමූහයකින් සමන්විත වන අතර මේවා සඳහා ක්‍රියාකාරි වෙළඳපලක් නැත. මෙම වත්කම් පළමුව සාධාරණ අගයට අනෙකුත් සම්බන්ධිත ගණුදෙනු පිරිවැය එකතුකිරීමෙන් පසු වටිනාගකමට හදුනාගන්නා අතර ඉන්පසු සඵල පොළි අනුපාත භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට හදුනා ගැනේ.

ණය හා ලැබිය යුතු දෑ,මුදල් හා මුදල් සමාන දෑ හා වෙළඳ අනෙකුත් ලැබිය යුතු දෑ වලින් සමන්විත වේ.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

3.3.1.1 මුදල් හා මුදල් සමාන දෑ

අත්පත්කරගත් දිනයේ සිට මුදල් ඉතිරියෙන්, මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වී ඇති අතර කළමණාකාරිත්වය විසින් කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා සඳහා මේවා යොදාගැනේ.

3.3.1.2 අනෙකුත් මූල්‍ය වත්කම්

මේවා පළමුව ඒවායේ ගණුදෙනු වටිනාකමට අගය කෙරේ. ඉන්පසු ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් වැනි දෑ සඵල පොළී අනුපාතය මත ගණනය කරන ක්‍රමක්ෂය පිරිවැයට අගය කෙරේ.

(a) මූල්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශන තුල හඳුනා නොගැනීම, අදාළ වත්කම කල්පිරීමෙන් හෝ මාරුකිරීමෙන් ඇතිවන මුදල් ප්‍රවාහයන් ලබාගැනීමේ ගිවිසුම්ගත බැඳීම හා අනෙකුත් සියලුම වත්කම සම්බන්ධ අවධානම් වාරුවීමෙන් අනතුරුවය. ඉන්පසු එම මූල්‍ය වත්කම් පාලනය කිරීමේ අයිතියක් ව්‍යාපාරයට රඳවා තබාගත නොහැක.

3.3.2 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම්

ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම් පළමුව සාධාරණ වටිනාකමට සෘජු සම්බන්ධිත ගණුදෙනු පිරිවැය එකතු කොට හදුනාගන්නා අතර ඉන්පසු සඵලපොළී අනුපාත භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට අගය කෙරේ.

අනෙකුත් ගෙවිය යුතු දෑ වලින් මූල්‍ය වගකීම් සමන්විත වේ.

(a) සමාගම විසින් මූල්‍ය වගකීම් සඳහි ඇති ගිවිසුම්ගත බැඳීම අත්හිටවීමකදී හෝ කල් ඉකුත්වීමකදී හදුනා නොගැනීම සිදුකරයි.

3.4 හානිකරණය

සමාගම විසින් සෑම ගිණුම්කරණ වර්ෂයකට වරක් වත්කම් හානිකරණය වී ඇති බවට කිසියම් හෝ පෙන්නුම් කිරීමක් සමාගමේ සිදු වී ඇත්දැයි තක්සේරු කල යුතුය. එසේ හදුනා ගතහොත්, එම වත්කමේ නැවත අයකරගත හැකි අගය ඇස්තමේන්තු කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල පෙන්විය යුතුය. හානිකරණ අලාභය අදාළ කාලච්ඡේදයේ ලාභ අලාභ හා විස්තීරණ ආදායම් ප්‍රකාශයට මාරු කල යුතුය.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම
මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

3.5 වගකීම් හා වෙන්කිරීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ජංගම වගකීම් ලෙස ඉල්ලුම මත ගෙවීමට අදාළ වගකීම් හෝ වර්ෂයක් ඇතුලත ගෙවිය යුතු වගකීම් දැක්වේ.

වෙන්කිරීමක් යනු, අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස පැන නැගුනු සමාගමේ ආර්ථික සම්පත් පිටතට ගලයාමේ භාව්‍යතාවයක් පවතින නිවැරදිව තක්සේරු කල හැකි වර්තමාන බැදීමයි.

3.6 අයභාරය

පොළී ආදායම සඵල පොළී අනුපාතය මත කල්පිරීමේ කාලය දක්වා හදුනාගන්නා අතර ලාභාංශ ආදායම හදුනාගෙන ඇත්තේ ආදායම ලැබීමට හිමිකම ලැබීමෙන් පසුවය.

3.7 මූල්‍ය ආදායම්

සමාගමේ මූල්‍ය ආදායම් සමන්විත වන්නේ ආශ්‍රිත සමාගම් වලින් ලැබෙන ලාභාංශ ආදායමින්ය.

3.8 වියදම්

ව්‍යාපාරය අදාළ සියලුම වියදම් මෙම වර්ෂයට ගලපන අතර නඩත්තු හා අළුත්වැඩියා වියදම් ඇතිවීමෙන් පසු ලාභ අලාභ ප්‍රකාශයට ගලපයි.

යම්කිසි වියදමක්, වත්කමක් අත්පත්කරගැනීම, වැඩිදියුණු කිරීම හෝ වර්ධනය කිරීමට ස්ථිර ස්භාවයෙන් වැය කර ඇත්නම් ඒ තුලින් සමාගමේ අදායම් ඉපයීමේ හැකියාව වැඩිවේනම්, එම වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකයි.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

3.9 දේපළ පිරියත හා උපකරණ

3.9.1 හඳුනාගැනීම හා මිනුම්කරණය

දේපළ පිරියත හා උපකරණ සඳහා දැරූ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය හා හානිකරණ අලාභ අඩුකිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

යම් කිසි දේපළ, පිරියත හා උපකරණ ඒකකයක ඵලදායි ජීව කාලය එකිනෙකට වෙනස් කොටස් ඇත්නම් ඒවා වෙන වෙනම ගිණුම්ගත කල යුතුය.

යම් දේපළක් ඉවත්කිරීමෙන් ඇතිවූ ලාභය හෝ අලාභය ලාභ, අලාභ ප්‍රකාශයට මාරු කෙරේ.

3.9.2 අත්පත් කරගැනීමෙන් පසු වියදම්.

මෙම වියදම් තුලින් ව්‍යාපාරයට අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා එන්නේ නම් පමණක් ප්‍රාග්ධනගත කෙරේ.

එදිනෙදා සිදු කරන නඩත්තු සේවා වියදම් අදාළ දේපළ පිරියත හා උපකරණ වල වියදමක් ලෙස සලකයි.

3.9.3 ක්ෂය

දේපළ පිරියත හා උපකරණ වල දැරූ පිරිවැයෙන් සුන්බුන් අගය අඩුකොට ඉතිරිය මත සරල මාර්ග ක්‍රමයට ඒවායේ ඵලදායි ජීවකාලය පුරාවට ක්ෂය ගණනය කරයි.දේපළ පිරියත හා උපකරණ වල ඵලදායි ජීව කාලය පහත පරිදි වේ.

කාර්යාල උපකරණ වර්ෂ 4

යම් කිසි වත්කමක ක්ෂය අනුපාතය ඵලදායි ජීව කාලය හෝ සුන්බුන් අගය සැලකිය යුතු අයුරින් වෙනස් වී නම්, අදාළ වත්කම් ක්ෂය අනාගතයට බලපාන අයුරින් සංශෝධනය කෙරේ.

3.10 ආදායම් බදු වියදම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට බලපාන ප්‍රමිත වලට අනුව වර්ෂයට අදාළ බදු වියදම ලෙස හඳුනාගත යුත්තේ වර්තමාන බදු වියදම හා විලම්බිත බදු වල එකතුවයි. ආදායම් බදු වියදම ආදායම් ප්‍රකාශය තුල හඳුනාගෙන ඇත.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

3.10.1 වර්තමාන බද්ද

කාලච්ඡේයේදී උපයන ලද ආදායම මත ගෙවිය යුතු වැඩිපුර ගෙවූ හා පෙර වර්ෂ වලට අදාළ හිඟ හෝ අතිරික්ත බද්ද ශේෂ පත්‍ර දිනට සමාගම සතුව පවතින බදු බැරකම හෝ වැඩිපුර ගෙවූ ආදායම් බදු ප්‍රමාණය පෙන්නුම් කරයි. කාලච්ජේදයට අදාළ බදු වියදම ආදායම් ප්‍රකාශයේ පෙන්නුම් කෙරේ.

ආදායම් බදු වෙන්කිරීම් පදනම් වන්නේ 2006 අංක 10 දරණ දේශිය ආදායම් පනත හා ඉදිරියට කරන ලද වෙන්කිරීම් මත ගලපන ලද ලාභය මතය.

3.10.2 විලම්භිත බදු

විලම්භිත බදු හදුනාගැනීම සිදු කරන්නේ බදු පදනම සඳහා භාවිතා කරන වටිනාකම් සහ මූල්‍ය වාර්තාකරණ පදනම සඳහා භාවිතා කරන වත්කම් හා වගකීම් වල ධාරණ අගයන් අතර තාවකාලික වෙනස්වීම් පදනම් කොටගෙනය. මෙම කාලච්ජේදය තුලදී තාවකාලික වෙනස්වීම් කිසිවක් නොමැති බැවින් විලම්භිත බදු නැත.

3.11 ප්‍රකාශිත ප්‍රාග්ධනය

නිකුත් කල ඇති කොටස් මත මුදලින් ලද හෝ ඇරයුම් කල ඇති මුළු ප්‍රමාණය සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ලෙස ගිණුම්ගත කර ඇත.

සමාගමේ සාමාන්‍ය කොටස්කරුවන් සමාගම විසින් කලින් කලට ප්‍රකාශ කරනු ලබන ලාභාංශ ලැබීම සඳහා හිමිකම් ලබන අතර එක් සාමාන්‍ය කොටසකට එක් ඡන්දය බැගින් හිමිවේ.

3.12 සේවක ප්‍රතිලාභ

3.12.1 කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

සේවයට අදාළ සේවා සැපයීම නිසා කෙටිකාලීන සේවක ප්‍රතිලාභ ගෙවීම් සිදු කරනු ලැබේ.

3.12.2 නිර්ණය කරන ලද දායකත්ව සැලසුම

නිර්ණය කරන ලද දායකත්ව සැලසුම්, සේවය හමාර කිරීමේදී ගෙවිය යුතු ප්‍රතිලාභ සඳහා සමාගම විසින් වෙනම ඒකකයක් පිහිටුවා ඇති අතර දායක මුදල් වලින් ඔබ්බට විහිදුන නෛතික හෝ වෙනයම් බැඳියාවක් නොමැත.

දායකත්ව මුදල් දරන කාලච්ඡේදයේදී වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති අතර සියලුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකත්වය අරමුදලට හිමිකම් ලබති.

- **සේවක අර්ථ සාධක අරමුදල**

  ආයතනය හා සේවකයන් විසින් සේවකයාගේ දළ පාරිශ්‍රමිකයෙන් 12% හා 8% පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට බැර කරයි.

- **සේවක භාරකාර අරමුදල**

  ආයතනය විසින් සේවකයාගේ දළ පාරිශ්‍රමිකයෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට බැර කරයි.

3.13 වාර්තාකරණ දිනයට බල නොපාන නව ගිණුම්කරණ ප්‍රමිත හැඳින්වීම

වාර්තාකරණ දිනයට බල නොපාන නව ගිණුම්කරණ ප්‍රමිත හා සංශෝධන අදාළ සාමාගම විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ කර නොගත් අතර එම ප්‍රමිතයන් පසු වර්ෂවලදී අදාළ වේ.

3.13.1 මූල්‍ය උපකරණ

මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 (මූල්‍ය උපකරණ), දැනට පවතින ගිනුම්කරණ ප්‍රමිත අංක 39 (මූල්‍ය උපකරණ - හඳුනාගැනීම හා මැනීම) වෙනුවට යොදාගෙන ඇත.ප්‍රමිත අංක 09 තුළ මූල්‍ය උපකරණ බෙදා වෙන්කිරීම හා මැනීම පිළිබඳ මගපෙන්වීම් ඉදිරිපත් කර ඇති අතර මූල්‍ය වත්කම් හානිකරණය ගණනය කිරීම සඳහා නව ආකෘතියක් ද ඇතුලත් කර ඇත.මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 බලාත්මක වන්නේ 2018 ජනවාරි 01 දින ආරම්භයේ සිටය.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

4 දේපළ පිරියත හා උපකරණය

පිරිවැය	**සින්නක්කර දේපළ**	**කාර්යාලීය උපකරණ රු.**	**එකතුව**
2016 අප්‍රේල් 01 දින ශේෂය	626,473	13,166	636,639
එකතු කිරීම්	-	-	-
ඉවත් කිරීම්	-	-	-
2017 මාර්තු 31 දිනට ශේෂය	626,473	13,166	636,639
සමුච්චිත ක්ෂය			
2016 අප්‍රේල් 01 දිනට ශේෂය	-	13,166	13,166
වර්ෂය සඳහා අයකිරීම්	-	-	-
ඉවත් කිරීම්	-	-	-
2017 මාර්තු 31 දිනට ශේෂය	-	13,166	13,166
ශුද්ධ පොත් අගය			
2017 මාර්තු 31 දිනට	626,473	-	626,473
2016 මාර්තු 31 දිනට	626,473	-	626473

ඉඩමේ අයිතිය සමාගම සතුව පැවතිය ද භුක්ති විඳීමේ අයිතිය සමාගමේ සතුව නැත.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

5. ආශ්‍රිත සමාගම් හි ආයෝජන

5.1 ආශ්‍රිත සමාගම් හි සාධාරණ වටිනාකම හදුනා ගැනීම.

මාර්තු 31 දිනට	කොටස් ගණන	2017 %	2016 %	සාධාරණ අගය 2017 රු.	2016 රු.
ලංකා අශෝක් ලේලන්ඩ්	1,512,500	42	42	1,606,275,000	2,289,071,500
පීඑල්සී				1,606,275,000	2,289,071,500

5.2 ආශ්‍රිත සමාගම් හි සාධාරණ වටිනාකම වෙනස්වීම් හදුනා ගැනීම.

	2017 මාර්තු 31 දිනට ශේෂය	අතිරික්තය/ (ඌනතාවය)	2016 මාර්තු 31 දිනට ශේෂය
ලංකා අශෝක් ලේලන්ඩ්			
පීඑල්සී ආයෝජන	1,606,275,000	(682,742,500)	2,289,017,500
	1,606,275,000	(682,742,500)	2,289,017,500

මාර්තු 31 දිනට

6 ආයෝජන

	2017 රු.	2016 රු.
ස්ථාවර තැන්පතු (සටහන 6.1)	4,187,950	3,650,000
භාණ්ඩාගාර බිල්පත් (සටහන 6.2)	52,536,364	52,603,592
	56,734,314	56,253,592

6.1 ස්ථාවර තැන්පතු

මහජන බැංකුව	3,000.000	2,500,000
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	1,183,950	1,150,000
	4,187,850	3,650,000

6.2 භාණ්ඩාගාර බිල්පත්

ලංකා බැංකුව	2,536,364	2,603,592
මහජන බැංකුව	30,000,000	30,000,000
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	20,000,000	20,000,00
	52,536,364	52,603,592

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

7. මුදල් හා මුදල් සමාන දෑ

බැංකු මුදල්	5,339,890	4,460,004
මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා වූ මුදල් හා මුදල් සමාන දෑ	5,339,890	4,460,004

8. ප්‍රකාශිත ප්‍රාග්ධනය

මාර්තු 31 දිනට	2017		2016	
	කොටස් ගණන	කොටස් වල වටිනාකම	කොටස් ගණන	කොටස් වල වටිනාකම
වර්ෂය ආරම්භයේ ශේෂය	2,150,000	15,750,000	2,150,000	15,750,000
	-	(6,791,400)	-	(6,791,400)
වර්ෂය අවසානයේ ශේෂය	2,150,000	8,958,600	2,150,000	8,958,600

සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ගෙවා නිමි සාමාන්‍ය කොටස්වලින් සමන්විත වන අතර එමගින් කොටස්හිමියන්ට ලාභාංශ ලැබීමට හිමිකම් ලැබෙන අතර සමාගමේ රැස්වීමකදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා හිමිකම් ඇත.

9 උපචිත ආදායම් බදු

මාර්තු 31 දිනට	**2017 (රු.)**	**2016 (රු.)**
අප්‍රේල් 01 දිනට ශේෂය	698,984	384,301
වර්ෂය සඳහා වෙන්කිරීම	1,797,367	1,087,308
වර්ෂය ඇතුළත සිදුකල ගෙවීම්	(698,984)	(384,301)
සවිස්තරාත්මක බදු බැර	(598,491)	(381,824)
රඳවාගැනීමේ බදු	(36,162)	(6,500)
මාර්තු 31 දිනට ශේෂය	1,162,715	698,984

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017 (රු.)	2016 (රු.)
10.අයභාරය	6,419,171	3,883,244
පොලී ආදායම්	6,419,171	3,883,244

11. ශුද්ධ මූල්‍ය ආදායම්

ලාභාංශ අදායම්	34,031,250	54,450,000
	34,031,250	54,450,000

12. බදු පෙර ලාභය

බදු පෙර ලාභය ගණනය කිරීමේදී පහත වියදම් අඩුකර ඇත.

අධ්‍යක්ෂ පාරිශ්‍රමික	1,725,600	1,147,500
විගණන ගාස්තු	52,000	64,147
සේවක වියදම්	584,000	524,200
ලේකම් දීමනාව	264,000	240,000
ක්ෂය	-	1,396

13. බදු වියදම්

ආදායම් බදු වියදම් (සටහන් 13.1)	1,797,368	1,807,308

සමාගම විසින් ආදායම් බදු සඳහා බද්දට යටත් ලාභයෙන් 28% කට වග කියන අතර සියලුම වෙන්කිරීම් 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතට අනුගත වේ.

13.1 ආදායම් බදු වියදම් සඳහා ගිණුම්කරණ ලාභය සැසඳීම.

මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017 (රු.)	2016 (රු.)
බදු පෙර ලාභය	(646,014,608)	378,051,405
වෙනත් මූලාශ්‍රයන්ගෙන් ඇති වූ ආදායම් හා නිදහස් ආදායම්	(40,450,421)	(58,333,244)
බදු සඳහා ඉඩනොදෙන සමුච්චිත වියදම්	682,742,500	285,596
බදු සඳහා අඩුකිරීමට ඉඩදෙන වියදම්	-	(322,767,500)
බද්දට යටත් ලාභය / අලාභය	(3,722,529)	(2,763,743)
පොළී ආදායම්	6,419,171	3,883,241
බද්දට යටත් ලාභය	6,419,171	3,883,241
ආදායම් බද්ද 28%	1,797,368	1,087,308

13.2 තාවකාලික වෙනම්වීම් කිසිවක් නොමැති නිසා විලම්භිත බදු සඳහා යටත් නොවේ.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

14.සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම

14.1 සම්බන්ධිත පාර්ශවයන් සමග වූ ගණුදෙණු

සමාගම විසින් සම්බන්ධිත පාර්ශවයන් සමඟ සිදුකරන ගණුදෙණු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන් යටතේ LKAS 24 යටතේ දක්වා ඇත.

සම්බන්ධිත පාර්ශවයේ නම	අධ්‍යක්ෂවරුන්ගේ නම්	ගණුදෙනු ස්වභාවය	ගණුදෙනුවේ වටිනාකම (රු.)
ලංකා අශෝක් ලේලන්ඩ් සීඑල්සී	එම්.එස්.මීරාසහීබ් මහතා (ලංකා අශෝක් ලේලන්ඩ් පීඑල්සී - සභාපති) ඒ.කේ.එම්.ජහන්සර් (ලංකා අශෝක් ලේලන්ඩ් පීඑල්සී - අධ්‍යක්ෂ)	ලාභාංශ ලැබීම්	34,031,250

14.2 ප්‍රධාන කළමණාකාරිත්වය හා ඔවුන්ගේ පවුලේ අය සමඟ ගණුදෙනු කිරීම.

කුඩා හා මධ්‍යම ව්‍යවසාය සමාගම සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (33 කොටස) අනුව "සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගණුදෙණු" ඉහළ කළමණාකාරිත්වය සතුව සමාගමේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා පාලනය කිරීමේ අයිතිය හා වගකීම සතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලය හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සම්බන්ධිත පාර්ශවයන් ලෙස සැලකේ. වර්ෂය තුලදී පවුලේ සාමාජිකයන් සමඟ කිසිදු ගණුදෙණුවක් සිදු වී නැත.

14.3 ප්‍රධාන කළමණාකාරිත්යන් සඳහා වන්දි

මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017 (රු.)	2016 (රු.)
කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	1,725,600	1,147,500

14.4 අධ්‍යක්ෂවරු සඳහා ණය

සමාගම විසින් අධ්‍යක්ෂවරු වෙත ණය ලබා දී නැත.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

16. ප්‍රාග්ධන බැදීම්

වාර්තාකරණ දිනය වන විට මූල්‍ය ප්‍රකාශ වල අණාවරණය කිරීමට අවශ්‍ය ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැදීම් කිසිවක් නැත.

17. නඩු සහ හිමිකම් පෑම්

වාර්තාකරණ දිනය වන විට මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට හෝ ගැලපීම් සඳහා වූ සමාගමට එරෙහිව වූ නඩු තීන්දු කිසිවත් නැත.

18.වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් හෝ අණාවණය කිරීම සඳහා ප්‍රමාණවත් සිදුවීම් කිසිවක් වාර්තාකරණ දිනයෙන් පසුව සිදු වී නැත.